# ‘අපි නොදන්න Live on Stage’ ANIMAREAL තවත් වැඩක්

අපි මිනිස්සු විදියට හැමදාම වෙනස් දෙයක් දකින්න කැමතියි. වෙනස් දෙයක් කරන්න කැමතියි. අපි තුළම නිරන්තරයෙන් ඉල්ලන මේ වෙනස බොහෝ වේලාවට එළියට එන්නේ නැත්තේ, අපි අපි විසින්ම හදා ගත්ත සම්මතයක් තුළ හිරවෙලා ඉන්න නිසයි. ANIMAREAL අපි මේ සමාජය තුළ කකුළ ගහන්නේ ඒ වෙනස සොයාගෙන පාරභෞතිකයන්ට හසු නොවී ගමනක් යන්න උත්සහ කරණ පිරිසක් විදියට. අප ආයතනය විසින් සමාජගත කරණ සෑම සේවාවක් හරහම අපි අපගේ අනන්‍යතාව තහවුරු කරන්න උත්සහ ගන්නේ එකී වෙනෙසෙහි ඇති අවශ්‍යතාව කේනද්‍රකරගෙනයි.

එක්තරා ලස්සන දවසකදී ගාමින්දටයි සුනෙත්ටයි (පොඩි මල්ලී සහ චූටි මල්ලී) දෙන්නට අපි දුරකථන ඇමතුමක් දෙන්නේ ඒ වගේ අලුත් වැඩකට අදහසක් දෙන්න. “අපි නොදන්න Live” සිරස රූපවාහිනියේ අතිශයින් ජනප්‍රිය වුන රූපවාහිනී වැඩසටහනක්. මේ වැඩසටහනේ නිෂ්පාදකවරුන් මෙන්ම මේක මෙහෙයවනු ලැබුවේ කවුරුත් හොඳින් අඳුරන පොඩි මල්ලියි චූටි මල්ලියි. ඔවුන්ගේ මෙම වැඩසටහන් ආකෘතිය නිර්මණය වෙලා තිබුණේ රූපවාහිනී මාධ්‍ය කේන්ද්‍ර කරගෙන. අපි දැක්කා ඔවුන්ගේ මෙම වැඩසටහන තුළ දෝලනය වන අන්තර්ගතය වේදිකාවට ගේන්න පුලුවන් කියලා, කොටින්ම කියනවනම් ප්‍රේක්ෂකයන්ට මේක සජීවීව විඳින්න අවස්ථාවක් තියනවා කියලා. එදා දුරකථන ඇමතුමෙන් අප කළ යෝජනාව අද සැබෑවක් වී ප්‍රථම වතාවට ඔවුන්ගේ හැකියාවන් සජීවීව වේදිකාවක නැරඹීමේ අවස්ථාව ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ඔබට උදා වී තිබෙනවා.

ඔබට මතකද අපි නව කවි සරණිය රසාස්වාදය කරද්දී අපි රසවින්ද ජේ.බී සේනානායකගේ “ කටහඬ” කවි පන්තිය. අපි එහෙම කියන්නේ ඇත්තටම ගාමින්ද ප්‍රියවිරාජ් සහ සුනෙත් චිත්‍රානන්ද කියන්නේ කටහඬ නිසා බොහෝ දුර වේගයෙන් පැමිණි දෙන්නෙක් නිසයි. ඔබ කවුරුත් දන්නවා සූරපප්පා සිංහල හඬ කැවූ කාටුන් වැඩසටහන ඔවුන් දෙදෙනා එහි හඬ කැවූ කාටුන් වැඩසටහන ඔවුන් දෙදෙනා එහි හඬ කැවීම් ශිල්පීන් දෙදෙනෙකු ලෙස සහභාගී වූවා පමණක් නොව මොවුන් දෙදෙනා ගැයූ සූරපප්පා ගීතය අතිශය ජනප්‍රිය එකක් වුනා. ඒ වගේම “ලයිට් එනකම්”, “අරේ සහ මරේ” යන ඔවුන් විසින් නිෂ්පාදනය කරමින් මෙහෙයවූ ගුවන් විදුලි වැඩසටහන්ද ශ්‍රාවකයින් අතර අතිශයින්ම ජනප්‍රිය වුනා. ඉන්පසුව “අපි නොදන්න Live” යන රූපවාහිනී වැඩසටහන සමඟ චූටි මල්ලී සහ පොඩි මල්ලී ලෙස අතිශයින් ජනප්‍රිය වූ මොවුන් දෙදෙනා රූපවාහිනී වෙනසක් “අපි නොදන්නා Live” වැඩසටහන හරහා සිදු කලා.



ඇනස්ලි, බර්ටි, සැමුවෙල්, මර්සි ඔබ අපි හැමෙ-ර්ම දන්න අපිව සිනහ සාගරයේ ගිල් වූ ශිල්පීන් පිරිසක්. ඔවුන්ගේ “විනෝදසමය” වගේ වැඩසටහන් ප්‍රේක්ෂකයන් අතර අතිශයින් ජනප්‍රියා වුනා. ඒ යුගයත් සමඟ පසුකාලීනව ඔවුන්ට සාපේක්ෂව මාධ්‍ය හරහා එවැනි වටිනාකමක් ඇති විකට චරිත බිහි වූවාද කියන එක ප්‍රශ්නාර්තයක්. නමුත් අපි විශ්වාස කරනවා පොඩි මල්ලී සහ චූටි මල්ලී එකතුව කෙරෙන “අපි නොදන්න Live” වැඩසටහන තුළින් ඔවුන්ට අනන්‍ය වූ ප්‍රේක්ෂක විශ්‍දානයට නිර්මාණාත්මක අයුරින් සම්බන්ධවන විකට චරිතයන් දෙකක් බිහිවුනා කියලා.

**ගාමින්ද (පොඩි මල්ලී) :** අද සමාජය දිහා බලන්න. අපි පාරට බැස්සොත් දකින්න වෙන්නේ ජොබ් පෝලිමක්, සමහර වෙලාවට අපිට හිතෙන්නේ, දුකින් ඉන්න මිනිස්සුන් ඔවුන්වත් නොදැන ජෝකර්ලා වෙලා කියලා, උදාහරණයක් විදිහට සමහර මිනිස්සු බස්වල නගින්න පොරකනවා. ගහමරා ගන්නවා. මේ විදිහට රණ්ඩු වෙවී නැග්ගත් ඉදගන්න සීට් එකක්වත් නැහැ. ඒත් පොරකකා නගිනවා. ඉතින් මේවා විහිළු නෙමෙයිද? අපේ මේ ප්‍රොග්‍රෑම් එකෙන් කරන්නේ අන්න ඒ වගේ දේවල් විහිළුවෙන් පොලිෂ් කරලා මිනිස්සුන්ට බලන්න දෙන එක. මුලින්ම බිහිවූ “අපි නොදන්න බසඩැ” ගැන ගාමින්ද දැක් වූ එක අදහසක් ඒක.

**සුනෙත් (චූටි මල්ලී) :** අපේ රටේ ස්ටයිල් දෙකක පිරිස් ඉන්නවා. මේ දෙපිරිසගෙන් එක් පිරිසක් ඉන්නවා සිංහල වචන අතරට ඉංග්‍රීසි වචන දාලා කතා කරන (සිංහල වචනවලට නොගැලපෙන ඉංග්‍රීසි වචන දාලා කතා කරන පිරිසක් කිව්වොත් නිවැරදියි) ඒ අය අඳින්නේ බටහිර පන්නෙට, ඇවිදින්නේ ඉංග්‍රීසි පන්නෙට. ඉතින් මේ කවලම් ඉංග්‍රීසි සිංහල පංතිය නියෝජනය කරන කෙනෙක් හැටියට තමයි මම “අපි නොදන්න බසඩැ” වැඩසටහන මෙහෙය වන්නේ.

සුනෙත් තමන්ගේ වැඩසටහන් මෙහෙය වීම සම්බන්ධයෙන් අදහස් පළකලේ එහෙම. රූපවාහිනී මාධ්‍ය හරහා විකාශනය වන සජීවී වැඩසටහන් (Live programme) දෙස විවේචනාත්මකව සහ ප්‍රහසනාත්මකව බැලූ පොඩි මල්ලී සහ චූටි මල්ලී සජීවී වැඩසටහන් හරහා බිහිවූ පොර සංකල්පයට ඔවුන්ගේ සජීවී වැඩසටහන් හරහා බිහි වූ පොර සංකල්පයට ඔවුන්ගේ වැඩසටහන හරහා දැඩි අතුල් පහරක් එල්ල කලා කීවොත් නිවැරදිය.

“අපි නොදන්න බසඩැ” වැඩසටහන සහ චූටි මල්ලී සහ පොඩි මල්ලී යන චරිත ඕස්ට්‍රේලියාවේ මෑත භාගයේදී සංක්‍රමනය කල (වසර දහයක පමණ කාල පරාසයක) බොහෝ දෙනෙකුට අලුතින් මතක් කළ දිය යුතු දෙයක් හෝ චරිතයක් නෙමෙයි. ඒත් මේ වැඩසටහන සංවිධානය කරන අවස්ථාවේ අපි දන්නවා මීට අවුරුදු 15කට 25කට ඉස්සෙල්ලා සංක්‍රමණය කරපු ඔබ බොහෝ දෙනෙකුට මොවුන්ගේ හැකියාවන් බලන්න විඳින්න උදාවෙලා නැතිව ඇති කියලා. ඒත් අප පෙර කියූ අයුරුත් ඔබ සියලු දෙනා ඇනස්ලි, බර්ටි, සැමුවෙල්ගේ විහිළු රස වින්ද පිරිස අතරින් ඉදිරියෙන්ම සිටිය බව අප දන්නවා. එදා ඔබ අගය කළ ඒ ජනප්‍රිය විකට චරිතයන්ට සාපේක්ෂව පසුකාලීනව බිහිවූ පොඩි මල්ලී, චූටි මල්ලිගේ “අපි නොදන්න බසඩැ දබ් ඒටැ” වැඩසටහනට අලුත්ම අත්දැකීමක් එකතු කරනවා කියන එක සම්බන්ධයෙන් අපට සැකයක් නැහැ. සැබවින්ම ඔවුන්ගේ මෙම වැඩසටහන් අන්තර්ගතය තුළින් ප්‍රහ්‍යනයට හසුවන්නේ ලාංකීය මාධ්‍ය හැසිරිවීම පමණක් නොව සාමාන්‍ය ලාංකිකයන්ගේ එදිනෙදා ජීවිත තුළ ඇති හිඩස ඔවුන් ප්‍රහ්‍යනයට ඔවුන් ප්‍රයෝජනයට ගන්නවා.

“අපි නොදන්න බසඩැ දබ් ඒටැ” වැඩසටහන පෙබරවාරි 17 වෙනිදා හාබැහ නුවර ඊදඅප්බ ශාලාවෙත් පෙබරවාරි 24 වෙනිදා ඊමරඅදදා ඊැබ ශාලාවෙත් පවත්වන්න සියලු වැඩ කටයුතු සූදානම් කරලා තියෙන්නේ. මේක සැබවින්ම පවුලේ සැමට එකට රස විඳිය හැකි විනෝදාත්මක වැඩසටහනක්. ඒ වගේම මෙතෙක් ඔබ වේදිකාව තුළ නොදුටු ප්‍රහසනාත්මක ආකෘතියක්. ඉතින් හෂජ්සෑබ අපි ඔබ සැමට ඉතා ගෞරවයෙන් ආරාධනා කරනවා එන්න මේ අත්දැකීම විඳගන්න කියලා.

සටහන
ANIMAREAL අපි




සන්නස online
www.sannasa.net or www.sannasa.com

